# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/14 - 2015 දෙසැම්බර් මස 29 වැනි අඟහරුවාදා - 2015.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### විනිමය පාලන පනත යටතේ දැන්වීම
### (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරිය)

(1) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC) සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට ඉහත ගිණුම්වල පවතින ශේෂයන් භාවිතා කරමින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින් වෙත පහත ගෙවීම් සිදු කිරීම සඳහා අවසර ලබාදෙන බව විනිමය පාලන පනතේ 3 වගන්තිය සමග කියැවෙන එකී පනතේ 7 වගන්තිය යටතේ මෙමගින් නිවේදනය කරනු ලැබේ.

(i) අංක 1947/13 දරන 2015.12.29 දිනැති රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද විධානය මගින් මුදල් අමාත්‍යවරයා විසින් අවසර ලබාදී ඇති සුරැකුම්පත් අත්පත් කර ගැනීමට; සහ

(ii) ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් ඕනෑම වත්කමක් අත්පත් කර ගැනීමට හෝ ජංගම (ප්‍රාග්ධන නොවන) ගනුදෙනු සම්බන්ධයෙන් වන විනිමය පාලන බාධාවන් ඉවත් කිරීම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද 1994.03.18 දිනැති අංක EC/06/94 දරන මෙහෙයුම් උපදෙස් හා අංක EC/D/GL/1994/2 දරන මාර්ගෝපදේශයන් ප්‍රකාරව ජංගම ගිණුම් ගනුදෙනු සඳහා ගෙවීම් කිරීමට.

ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මිය,
විනිමය පාලක.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

01 - 503